# (ඊ) කාලීන නියැදි සමීක්ෂණ

1974 වසර තුළදී සමීක්ෂණ 4 ක් නිම කොට ඇති අතර, නව සමීක්ෂණයක් ආරම්භ කෙරිණ. නිම කොට ඇති සමීක්ෂණ පහත සඳහන් වේ.

1 උඩවලවේ යෝජනාක්‍රම ප්‍රදේශයේ ශිල්පීය ආර්ථික සමීක්ෂණය
2 මහවැලි සංවර්ධන ප්‍රදේශයේ වර්ධනය පිළිබඳ මූලික සමීක්ෂණය
3. ශ්‍රී ලංකාවේ කම්කරු සහභාගිතා අනුපාතිකය නිර්ණය කිරීමේ සමීක්ෂණය
4. පාරිභෝගික මූල්‍ය සමීක්ෂණය - 1973

පහත සඳහන් නව සමීක්ෂණය ආරම්භ කෙරිණ.

ශ්‍රී ලංකාවේ ඉඩම් හා ශ්‍රම උපයෝගිතා සමීක්ෂණය

## 1. උඩවලවේ යෝජනාක්‍රම ප්‍රදේශයේ ශිල්පීය - ආර්ථික සමීක්ෂණය

1973 වර්ෂයේදී ආරම්භ කෙරුන උඩවලවේ යෝජනාක්‍රම ප්‍රදේශයේ ශිල්පීය - ආර්ථික සමීක්ෂණය පිළිබඳ ක්ෂේත්‍ර කටයුතු 1974 දෙසැම්බර් මාසයේදී අවසන් කෙරිණි මෙම සමීක්ෂණයේ මූලික පරමාර්ථය වූයේ ලබාගත හැකි මානව හා ස්වාභාවික සම්පත්වලට අදළ ආර්ථික ශක්‍යතාවන් මිනීමත්, ගොවි ආර්ථිකයට අදළ ගැටළු හඳුනා ගැනීම සහ විශ්ලේෂණය කිරීමත් ය.

තෝරාගනු ලැබූ නියැදිඝක ගොවීන් සමූහයකගෙන් සමීක්ෂණ කාලය තුළදී ප්‍රධාන භෝග වර්ග නිෂ්පාදන පිරිවැය, සේවා නියුක්තිය, ඔවුන්ගේ ආදයම සහ වියදම, අධ්‍යාපනික සහ සෞඛ්‍ය පහසුකම් පිළිබඳව සතිපතා තොරතුරු එක්රැස් කෙරිණි. මෙසේ රැස්කර ගනු ලැබූ සංඛ්‍යා තොරතුරු දනට සකස් කරගෙන යනු ලැබේ.

## 2. මහවැලි සංවර්ධන ප්‍රදේශයේ වර්ධනය පිළිබඳ ආරම්භක සමීක්ෂණය

1974 වසර තුළ සැලසුම් කරනු ලදුව ක්‍රියාත්මක කෙරුණු මහවැලි සංවර්ධන ප්‍රදේශයේ වර්ධනය පිළිබඳ සමීක්ෂණය මගින්, නියැදි ගම් 15 ක සහ ජනපද යෝජනාක්‍රම 5 ක ජන සංඛ්‍යා අධ්‍යාපනය, සේවා නියුක්තිය, නිවාස පහසුකම්, විවිධසේවා මධ්‍යස්ථාන, ප්‍රවාහන පහසුකම්, ඉඩම් උපයෝගීතාවය, වගාක්‍රම, වාරිමාර්ග පහසුකම්, ස්ථිර වගා සහ හේන් ගොවි-තැනින් ලැබෙන ආදයම, ගෙවතු වගා සහ ග්‍රාමීය නායකත්වය පිළිබඳ සංඛ්‍යා තොරතුරු එක්රැස් කරනු ලැබිණි.

සමීක්ෂණ තොරතුරු වර්ගීකරණය නිම කොට ඇති අතර, දනට පිළියෙල කරගෙන යනු ලබන එහි වාර්තාව 1975 වර්ෂය තුළදී ප්‍රකාශයට පත්කරනු ලැබේ.

## 3. ශ්‍රී ලංකාවේ කම්කරු සහභාගිතා අනුපාතිකය නිර්ණය කිරීමේ සමීක්ෂණය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ඇරයුම පිට ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ විසින් ශ්‍රී ලංකාවේ කම්කරු සහභාගිතා අනුපාතිකයන් පිළිබඳ අධ්‍යයනයක සීමාවන් සහ විෂය පථය නිර්ණය කෙරෙන පර්යේෂණ යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් මෙම යෝජනාව පිළිගනු ලැබූ අතර මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පසුව මෙම පර්යේෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අනුමත කරන ලදී. මේ අනුව ශ්‍රී ලංකාවේ කම්කරු සහභාගිතා අනුපාතිකයන් නිර්ණය කිරීමේ නියැදි සමීක්ෂණය 1973 ජුලි 1 දින ආරම්භ කරන ලදී. සමීක්ෂණය 1973 අවසානයේදී නිම කෙරුන අතර, 1974 වර්ෂයේදී අවසාන වාර්තාව ප්‍රකාශයට පමුණුවන ලදී.

## 4. 1973 පාරිභෝගික මුදල් සමීක්ෂණය

1973 පාරිභෝගික මුදල් සමීක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද එවැනි සමීක්ෂණවල තුන්වැන්න වේ. මීට ඉහතදී මෙම සමීක්ෂණ පවත්වා ඇත්තේ 1953 සහ 1963 දීය. 1973 සමීක්ෂණයෙන් සොයාගත් කරුණු පිළිබඳ සංක්ෂේප වාර්තාවක් ඉකුත් මහ බැංකු වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ අතර මෙම සමීක්ෂණයේ අවසන් වාර්තාව දැන් ප්‍රකාශයට පත් කර ඇත.

## 5. ශ්‍රී ලංකාවේ ඉඩම් සහ ශ්‍රම උපයෝගිතා සමීක්ෂණය

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලැබූ ඉඩම් සහ ශ්‍රම උපයෝගිතා සමීක්ෂණයේ මූලික කටයුතු 1974 නොවැම්බර් මාසයේදී ආරම්භ කරන ලදී. දිවයිනේ සමීක්ෂණයක් වූ මෙය දෙසතියකට වැඩි කාලයක් මුළුල්ලේ පවත්වාගෙන යන ලදී. 1975 ජනවාරි 15 දින ආරම්භ කෙරුන ඉඩම් සහ ශ්‍රම උපයෝගිතා පිළිබඳ ප්‍රධාන සමීක්ෂණය සඳහා පදනම වූයේ මෙම සමීක්ෂණය මගින් රැස්කර ගනු ලැබූ සංඛ්‍යා තොරතුරුයි. ප්‍රධාන සමීක්ෂණය පිළිබඳ ක්ෂේත්‍ර කටයුතු 1975 ජනවාරි මාසයේදී ආරම්භ කොට 1975 මාර්තු මාසයේදී නිමාවට පත් කෙරිණි. මෙම සංඛ්‍යා තොරතුරු දැනට වර්ග කරගෙන යනු ලබන අතර, අවසන් වාර්තාව මෙම වර්ෂයේ මැද භාගයේදී පමණ ප්‍රකාශයට පත්කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.